රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 254

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 7.
1984 ජූනි මස 06 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## 1980 ජූලි මස සේවය අත්හැර ගිය නිලධාරීන් - උසස්වීම්

යම් නියමිත කාලයක් තුළදී සියළුම වැටුප් වර්ධක අඛණ්ඩව උපයා තිබීම හා/හෝ යම් නියමිත කාලයක් තුල කරන ලද වරදකට දඬුවම් නොලැබ තිබීම, සමහර රජයේ නිලධාරීන් උසස් කිරීමේදී අවශ්‍යතා වේ.

2. 1980 ජූලි මස තනතුරු අත්හැර ගිය පමණින්ම, නැවත සේවයේ පිහිටුවන ලද එවැනි නිලධාරියෙකුට උසස්වීමට සුදුසුකම් නැතැ යි සමහර දෙපාර්තමේන්තු ප්‍රධානීන් සළකා ඇත. තවද, 1980 ජූලි මස තනතුර අත්හැර ගියා සේ සළකන ලද නිලධාරීන් සම්බන්ධයෙන්, මෙම චක්‍රලේඛයේ 1 වැනි ඡේදයේ සඳහන් අවශ්‍යතා කෙසේ බලපාන්නේ ද යන්න ගැන විමසීම් ලැබී ඇත. මෙය රැඳා පවත්නේ, එසේ තනතුර අත්හැර ගිය නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවීමට පදනම් වූ විධිවිධාන මතය. ඒ විධිවිධාන ඇත්තේ අංක. අමප 410/80 හා 1980.12.03 දාතම දරණ ලිපියෙන් අමාත්‍ය මණ්ඩලයේ ලේකම් නිවේදනය කර ඇති අමාත්‍ය මණ්ඩලය තීරණය කළ උපදෙස් මාලාවෙහිය.

3. උපදෙස් මාලාවේ 4(1) හෝ 7(1) ඡේදය යටතේ යම් නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවා ඇත්නම් හා ඔහු අන් අයුරකින් නුසුදුසු නොවන්නේ නම්, මෙම චක්‍රලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් අවශ්‍යතා අතින් ඔහු 1980 ජූලි මස තනතුරු අත්හැර යෑම නිසා උසස්වීම සඳහා නුසුදුස්සෙකු වන්නේ නැත.

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

කු/06